කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදි (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)- 2021

2024 - අගෝස්තු

**BCOME 3045 - ජාත්‍යන්තර ආර්ථක විද්‍යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : (හයයි ) 06 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක - 01

අ. රටවල් ජාත්‍යන්තර වෙළඳාමේ නිරතවන හේතු මොනවාද ?

(ලකුණු 06)

ආ. ජාත්‍යන්තර වෙළඳමට පදනම් වූ න්‍යායන් තුනක් සඳහන් කරන්න. එම න්‍යායන් අතර ස්ථිතිකවාදීන් ලෙස පැහැදිලිව හඳුනාගත හැකි ආර්ථික විද්‍යාඥයන්ගේ අදහස් පිළිබඳ පැහැදිලි කරන්න.

(ලකුණු 08 )

ඇ. වටිනාකම පිළිබඳ ශ්‍රම න්‍යාය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 06)
(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 02

අ. සාපේක්ෂ පිරිවැය වාසි න්‍යාය ඉදිරිපත් කළ ආර්ථික විද්‍යාඥයා කවුද ? ඔහුගේ විග්‍රහයට අනුව සාපේක්ෂ පිරිවැය න්‍යායට පදනම් වූ උපකල්පන හතරක් සඳහන් කරන්න.

(ලකුණු 06)

ආ. රටවල් අතර ශ්‍රම ඵලදායීතාවය වෙනස්කම් හටගන්නා ආකාරය උදහරණ ඇසුරින් පෙන්නුම් කරන්න

(ලකුණු 06 )

ඇ. විශේෂ ප්‍රාගුණ්‍යය යනු කුමක්ද?

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක - 03**

අ. අභ්‍යන්තර කර්මාන්ත වෙළඳම සහ අන්තර් කර්මාන්ත අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ. වෙළෙඳ අනුපාතය යනු කුමක්ද? එය පැහැදිලි කිරීම සඳහා මෑතකාලීන සංඛ්‍යාලේඛන යොදා ගන්න.

(ලකුණු 08)

ඇ. පහත සඳහන් ඒවායින් ඕනෑම දෙකක් පැහැදිලි කරන්න

1. Arbitrage Operations - පරස්පර ජාවාරම්
2. නම්‍ය විදේශ විනිමය අනුපාතිකය
3. ඉදිරි විදේශ විනිමය අනුපාතය

(ලකුණු 06)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක - 04**

අ. තීරු බද්දක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද ? තීරු බද්දක් පැනවීමේ ප්‍රායෝගික තත්ත්වය රූපසටහනක් මගින් පැහැදිලි කොට තීරු බද්දක ආර්ථික ප්‍රතිවිපාක මොනවාදැයි සඳහන් කරන්න.

(ලකුණු 10)

ආ. තීරු බදු නොවන වෙළඳ බාධක පහක් නම් කරන්න.

(ලකුණු 05)

ඇ. ප්‍රපාතනය යනු කුමක්දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 05

අ. ආර්ථික ඒකාබද්ධ වීම් ජාත්‍යන්තර වෙළඳාමේ ප්‍රවර්ධනයට හේතු වී ඇත්තේ කෙසේදැයි යන්න කරුණු සහිතව පැහැදිලි කරන්න

(ලකුණු 08)

ආ. ආර්ථික ඒකාබද්ධ වීම් සඳහා උදාහරණ හතරක් සඳහන් කරන්න.

(ලකුණු 04 )

ඇ. ආර්ථික ඒකාබද්ධ වීම් සමග ශ්‍රී ලංකාව සිය වෙළඳාම වර්ධනය කර ගැනීම සඳහා සම්බන්ධ වී ඇත්තේ කෙසේද

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 06

අ. ගෝලීයකරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද ?

(ලකුණු 04)

ආ. ගෝලීය කරන ක්‍රියාවලිය සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළඳාමේ වර්ධනය සඳහා කෙසේ බලපා ඇත්දැයි සඳහන් කරන්න.

(ලකුණු 08)

ඇ. ගෝලීයකරණයේ ප්‍රතිලාභ ඉහළ නැගීම සඳහා තොරතුරු තාක්ෂණය සම්බන්ධ වී ලෝක වෙළඳාම ඉහළ දැමීම සඳහා ඉවහල් වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)